# සංවර්ධනාත්මක සන්නිවේදනය සහ දේශපාලනය

**එම්.කේ. නදිකා දමයන්ති**
**පර්යේෂණ නිලධාරිණී**
**කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය.**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

**සංවර්ධනය යන්න විවිධ අර්ථකතන ඔස්සේ විග්‍රහ කළ හැකිය. නවීන තාක්ෂණයේ සහ විද්‍යාවේ දියුණුව තුලින් ලැබූ සුඛෝපභෝගී භාණ්ඩ පරිහරණයත්, සුඛෝපභෝගී ජීවන රටාවත්, මං මාවත් දෙපස අහස උසට නැඟුණු ගොඩනැගිලිත් තුලින් කෙනෙකු සංවර්ධනය පිළිබඳ අදහසක් ඉදිරිපත් කළ හැකිය.** සංවර්ධනය තුල, එකී භෞතික සංවර්ධනයෙන් ඔබ්බට ගිය අධ්‍යාත්මික සංවර්ධනයක් ද ගැබ් විය යුතු බව තවත් කෙනෙකුගේ අදහස විය හැකිය. නූතන සමාජය එක් අතකින් භෞතික සංවර්ධනය ළඟා කරගන්නා අතරම අධ්‍යාත්මික සංවර්ධනයෙන් බැහැර වෙමින් හෝ ඉවතට තල්ලු වෙමින් සිටීම බොහෝ විට දකිය හැකි වේ. සමාජයට අවශ්‍ය පරිදි සංවර්ධනය තුලනාත්මකව මෙහෙයවීමේ දී සන්නිවේදන ක්‍රියාදමයට විශාල කාර්යභාරයක් පැවරේ. නූතන සන්නිවේදනයේ දී **රූපවාහිනිය, ගුවන්විදුලිය,** පරිඝනක තාක්ෂණයෙන් ක්‍රියාත්මක වන **විද්‍යුත් තැපැල** (e-mail), වෙබ් අඩවි ආදී විද්‍යුත් මාධ්‍ය මෙන්ම පුවත්පත්, සඟරා ආදී මාධ්‍යයන් ද බහුල වශයෙන් යොදා ගැනේ. එම මාධ්‍ය ඔස්සේ,

i. ප්‍රවෘත්ති සහ තොරතුරු සම්පාදනය
ii. විග්‍රහය සහ විවරණ සම්පාදනය
iii. අධ්‍යාපනය සහ සමාජානුයෝජනය
iv. පෙළඹවීම සහ දැන්වීම් ප්‍රචාරණය
v. වෙළඳාම සහ දැන්වීම් ප්‍රචාරණය
vi. විනෝදාස්වාදය සහ කලාව

යන අංග වලින් තොරතුරු සන්නිවේදනයට සම්බන්ධ වේ. එම මාධ්‍යයන් මෙම අංග හයෙන් සමාජයට සෘජු සහ වක්‍ර බලපෑමක් සිදු කිරීමට සමත් වේ. එම බලපෑම තුන් ආකාරයක විග්‍රහයකට ලක් කළ හැකි බව Defleur M.L. සහ Dennis E.E යන විද්‍යාඥයින් විසින් පෙන්වා දෙනු ලබයි. එනම්,

i. සමාජ වෙනසක් ඇති කිරීම පිළිබඳ බලපෑමක් ඇති කළ හැකිවීම.

ii. සමාජයේ පවතින යථාර්ථය ග්‍රහණය කර ගැනීමට හෝ එයින් කෙනෙකු ඈත් කොට තැබීමට හෝ ජනමාධ්‍යයට හැකියාව තිබීම.

iii. ජනප්‍රිය සංස්කෘතිකාංග බිහි කිරීමටත්, පවතින සමාජ තත්ත්වයට ආගන්තුක වූ සමාජ ප්‍රවණතාවන් ප්‍රවේශ කිරීමටත් ජනමාධ්‍ය මෙහෙයවීමට හැකිවීම යනාදී වශයෙනි.

ඉහත කරුණු පිළිබඳව සලකා බැලීමේ දී පැහැදිලි වන්නේ, කිසියම් රටක සංවර්ධනය සම්බන්ධයෙන් ජනමාධ්‍ය ක්ෂේත්‍රයට සුවිශාල වගකීමක් පැවරී ඇති බවයි. **ඇමරිකාව** වැනි සංවර්ධිත රටක් එම ආකාරයෙන් සංවර්ධනය වීම සඳහා නිවැරදි තොරතුරු සන්නිවේදනය විශාල පිටුබලයක් වූ බව පිළිගැනේ. නොඑසේ නම් එම රටවල සංවර්ධනයේ දී තොරතුරු සන්නිවේදනය කිසියම් උපක්‍රමශීලී ආකාරයකින් සංවර්ධන අරමුණු කරා ළඟාවීම සඳහා යොදගත් බව පෙනේ. **ඇමරිකානු ජාතිකයන්ගේ බදු මුදල් වලින් එකතු කරගත් ඩොලර් බිලියන ගණනක් වැය කොට නාසා** (National Aeronautic and Space Administration) **ආයතනය මිනිසෙකු සඳට යැවීම සඳහා මහජන මතයේ සහාය ලබාගත්තේ ජනමාධ්‍ය ක්ෂේත්‍රය හරහා මහජන මතය ඒ වෙනුවෙන් සකස් කිරීමට සමත් වූ බැවිනි.** එසේ නොමැතිව, ජනමාධ්‍ය විසින් **නාසා ආයතනය** මිනිසෙකු සඳට යැවීමට දරු උත්සාහය අනවශ්‍ය වියදමක් සහිත නිශ්ඵල කටයුත්තක් ලෙසින් අවතක්සේරුවකට ලක් කරමින් එම මුදල් වලින් ඇමරිකාවේ යටිතල පහසුකම්, නිවාස අවශ්‍යතා ආදිය සපුරාලීම වඩාත් සාර්ථකව සිදුකළ හැකි බව පවසමින් මහජන මතය, එයට විරුද්ධව ගොඩනැඟුවේ නම් මිනිසෙකු සඳට යැවීමේ කාර්යය හෝ එයින් උදකර ගත් නව යුගය, කිසිදු දිනෙක අත් කර ගැනීමට නොහැකි වීමට හෝ තවත් දීර්ඝ කාලයක් ඒ වෙනුවෙන් කාලය ගත කිරීමට ඉඩ තිබුණි. එමෙන්ම, ජනමාධ්‍ය විසින් ඒ ආකාරයට මහජන මතය සකස් නොකළා නම් සංවර්ධන ක්‍රියාවලියේ දී අවශ්‍ය

වන දේශපාලන නායකත්වය සහ අනුග්‍රහය ද, එයට කිසිදු දිනෙක නොලැබීමට ඉඩ තිබුණි. මෙහි දී, ජනමාධ්‍ය විසින් සමාජයට නව ප්‍රවණතාවක් ප්‍රවේශ කිරීමටත්, සමාජ වෙනසක් ඇති කිරීමටත් දායක වී ඇති අන්දම මනාව පැහැදිලි වේ. එමෙන්ම, මහජන සහභාගීත්වයෙන් තොරව ප්‍රජාතාන්ත්‍රික රජයක් නොපවතින බැවින්, මහ ජනයා වෙත මැනවින් තතු පහදා දීම සඳහා ද ජනමාධ්‍යයන්ගෙන් කෙරෙන්නේ මහඟු සේවාවකි. මෙහි දී, සමාජයේ පවතින යථාර්තය මැනවින් ඉස්මතු කර, සමාජය නිවැරදි දිසාවට යොමු කිරීමට මෙන්ම ජනතාවටත්, දේශපාලන අධිකාරියටත් යථාර්තය වසන් කර, සමාජය නොමග යැවීමට ද ජනමාධ්‍යයට හැකියාව පවතී. මේ නිසා, සමාජ සංවර්ධනයේ දී අභියෝගාත්මක බලයක් ජනමාධ්‍ය ක්ෂේත්‍රය සතුව පවතින බව පැහැදිලි වේ.

ප්‍රවෘත්ති සහ තොරතුරු සම්පාදනයේ දී නිවැරදිව තොරතුරු ගලායාමට සැලැස්වීමෙන් ජනමාධ්‍ය විසින් සංවර්ධන කාර්යය සඳහා දායකත්වය ලබා දීම සිදු කරයි. එමෙන්ම, සංවර්ධන අවශ්‍යතා ඉටුකර ගැනීමට අවශ්‍ය තාක්ෂණික ඥානය, නව සොයා ගැනීම් මෙන්ම අධ්‍යාත්මික සංවර්ධනය සඳහා අවශ්‍ය වන නොයෙකුත් මඟ පෙන්වීම් සිදුකිරීම මෙන්ම ඒ පිළිබඳ දැනුවත් භාවයක් සමාජයට ලබාදීම ද ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ වගකීමක් මෙන්ම කාර්යභාරයක් වේ. සමාජය දේශපාලන, සමාජ, ආර්ථික, සංවර්ධන, කලා, විනෝදස්වාද ආදී සියළු අංශ වලින් දැනුවත් කරමින් මනා සමාජානුයෝජනයකට ලක් කිරීමේ වගකීමෙන් බැහැර වීමට ජනමාධ්‍ය ක්ෂේත්‍රයට හැකියාවක් නොමැතිය. එසේ වුව ද, වර්තමානයේ සංවර්ධනය වෙමින් පවතින රටවල ජනමාධ්‍ය මඟින් එම කාර්යභාරය මැනවින් ඉටු කරන්නේද? යන්න ගැටළුවක්ව පවතින බව පෙනේ. එම තත්ත්වයට හේතු සාධක ගණනාවක් බලපා ඇති බව විමර්ශනාත්මකව බැලීමේ දී පැහැදිලි වේ. එයට එක් හේතුවක් ලෙසින් **දේශපාලනය සහ ජනමාධ්‍ය** අතර පවතින සම්බන්ධතාව පෙන්වා දිය හැකි අතර දේශපාලන අධිකාරිය මෙන්ම ජනමාධ්‍ය ක්ෂේත්‍රය ද තම වගකීම හා කාර්යභාරය මැනවින් වටහා ගෙන සිටී ද යන්න පිළිබඳ ගැටළුවක් මෙහි දී මතු වේ.

කිසියම් රටක් සංවර්ධනයට අදාළ ක්‍රියාමාර්ග ගැනීමේ දී ප්‍රතිපත්ති සම්පාදකයින්, ශිල්ප තාන්ත්‍රිකයන්, ජනමාධ්‍ය මෙන්ම දේශපාලන නායකත්වය ද වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබන බව නොරහසකි. **ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් සකස් කරනු ලබන ප්‍රතිපත්ති සහ සංවර්ධන වැඩ සටහන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීමේ දී දේශපාලන නායකත්වය විසින් මනා පෙළඹවීමක්, උනන්දුවක්, අනුග්‍රහයක් මෙන්ම නායකත්වය ද සැපයිය යුතු වේ.** එසේ නොවූ විට, එම වැඩසටහන් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වන අතර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකිවීමත්, අනපේක්ෂිත ප්‍රතිඵල උදාකිරීමත් සිදුවිය හැකිය. තුන්වෙනි ලෝකයේ රටවල සංවර්ධනය පිළිබඳ අත්දැකීම් තුළින් එය මනාව තහවුරු වේ. මේ සම්බන්ධ ශ්‍රී ලංකාවේ අත්දැකීම් ද එකී කරුණ මැනවින් තහවුරු කරන්නක් වේ.

1950 දශකයේ සිට ශ්‍රී ලංකාවේ ඉදිරි සංවර්ධන වැඩ කටයුතු සඳහා සකස් කළ දස අවුරුදු සැලසුම්, පස් අවුරුදු සැලසුම් ආදී විවිධ සංවර්ධන සැලසුම් සම්පාදනයන් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොවීම කෙරෙහි සැලසුම් සම්පාදනයේ දී, නිවැරදි දත්ත සහ තොරතුරු නොතිබීම මෙන්ම දේශපාලන නායකත්වය අවශ්‍ය පරිදි ඒවාට නොලැබීම ද පෙන්වා දිය හැකිය. **අගමැති බණ්ඩාරනායක** මහතාගේ අභාවයෙන් පසු 1950 දශකයේ ආරම්භ කරන ලද දස අවුරුදු සැලැස්මට මූලිකත්වයක් හෝ දේශපාලන නායකත්වයක් නොලැබී ගිය අතරම ඒ අතරතුර ඇති වූ ආණ්ඩු අස්ථාවරත්වය, දේශපාලන නායකත්වය එක් පක්ෂයකින් තවත් පක්ෂයකට මාරුවීම ආදී විවිධ හේතු සාධක නිසා එවැනි සංවර්ධන සැලසුම් යටපත් වී යාම දැකිය හැකිය. දේශපාලන බලය පක්ෂයෙන් පක්ෂයට මාරුවීමේ දී, ඒ ඒ පක්ෂවල අවශ්‍යතාවන් අනුව සංවර්ධන වැඩ සටහන් ද වෙනස්වීම බොහෝ විට සිදුවිය. මේ නිසාම විවිධ ආණ්ඩු බලයට පත්වීමත් සමඟ රටේ සංවර්ධනය වෙනුවෙන් සැකසූ සහ ක්‍රියාත්මක කරන වැඩ සටහන් ද වෙනස් විය. මේ නිසාම ශ්‍රී ලංකාව තුළ සංවර්ධනය වෙනුවෙන් සැකසූ සහ ක්‍රියාත්මක කරන වැඩ සටහන් ද, වෙනස් වීම සිදු විය. මෙහි දී, **ශ්‍රී ලංකාව** තුළ සංවර්ධනය පිළිබඳව හෝ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ දිගුකාලීනව පිළිගත් වැඩසටහනක් හෝ දර්ශනයක් නොවූ අතර සංවර්ධන වැඩ සටහන් අතර මඟ නතරවීමට එය ද එක් ප්‍රබල හේතුවක් වූ බව පැහැදිලිය.

මෙම හේතුව නිසා තුන්වෙනි ලෝකයේ රටවල සංවර්ධනය සම්බන්ධව, ඒ ඒ අංශ වලට පිළිගත් ජාතික ප්‍රතිපත්තියක් තිබිය යුතු අතර එවා ආණ්ඩු වෙනස්වීමත් සමඟ වෙනස් නොවන

සංවර්ධනයට හිතකර ප්‍රතිපත්ති විය යුතුය. **රටක සංවර්ධනය සම්බන්ධ තීරණාත්මක බලපෑමක් සහිත දේශපාලන අධිකාරියත්, ජන සන්නිවේදනයත් අතර සංවර්ධනය සම්බන්ධයෙන් තිබිය යුතු අනිවාර්ය අංගයන් ලෙස සහමතිකභාවයත්, සහයෝගීතාවත් හඳුන්වා දිය හැකිය.** ජනමාධ්‍ය විසින් හෙළිදරව් කරන සහ ඉදිරිපත් කරන තොරතුරු සැලසුම් සම්පාදනයට සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ දී ඉවහල් කර ගැනීමේ හැකියාව පවතින හෙයින් එම තොරතුරු නිරවද්‍ය, මධ්‍යස්ථ සහ විශ්වසනීය ඒවා විය යුතුය. එමෙන්ම, කිසියම් ප්‍රතිපත්තියක්, ක්‍රියාවක් හෝ වැඩසටහනක් පිළිබඳව ජනමාධ්‍ය විසින් කරන හෙළිදරව්වක් පක්ෂග්‍රාහීත්වයෙන් තොරව සාධාරණ සහ සද්භාවයෙන් යුතුව සිදු කරන්නේ නම් කිසියම් අවස්ථාවක එම සිදුවීම දේශපාලන අධිකාරිය විවේචනයට සහ අපහසුතාවට ලක් කරන්නක් වුව ද, ඒ තුළින් තම වැරදි නිවැරදි කර ගනිමින් ඉදිරියට යාමේ හැකියාවක් දේශපාලන අධිකාරියට තිබිය යුතුය.

අනෙක් අතට, ලොව බොහොමයක් මාධ්‍ය ආයතන පුද්ගලික හිමිකම මත ක්‍රියාත්මක වන නිසා එකී ආයතන විසින් බොහෝ විට අවසාන වශයෙන් ආයතන හිමිකරුවාගේ දේශපාලන මතිමතාන්තර නියෝජනය කිරීමටත්, ඒවා ජයග්‍රහණය කරවීමටත් ක්‍රියාකරනු දැකිය හැකිය. එවන් අවස්ථාවක, ප්‍රශ්නයක හෝ සිදුවීමක යථා ස්වරූපය ඉස්මතු වීමට වඩා දේශපාලන අභිමතාර්ථ වෙනුවෙන් ක්‍රියා කිරීම සිදුවිය හැකිය. එහි දී, සත්‍ය වශයෙන්ම මහජනයා දැනුවත් කිරීම සිදුවන්නේ වැරදි ආකාරයකට වන අතර මහජන මතය ගොඩ ගැනීම සිදුවන්නේ ද එයට සමාන්තරව වැරදි සහගත අන්දමකිනි. එහි අවසාන ප්‍රතිඵලය ලෙසින් ගන්නා තීන්දුව ද වැරදි සහගත එකක් වනු නොඅනුමානය.

ශ්‍රී ලංකාවේ සංවර්ධන සිහිනය මල් ඵල ගැන්වීමට ප්‍රමුඛ පෙළේ බාධාවක් වූ විසි වසරක යුද්ධය නිමා කර, සාමය අත්පත් කර ගැනීම සඳහා ජනතාව පොදු මතයකට ගෙන ඒමේ හැකියාව රටේ ජන මාධ්‍ය වෙත පැවරී ඇත. එසේ වුව ද, පසුගිය කාලය පුරාම විවිධ න්‍යාය පත්‍රයන් ඔස්සේ ක්‍රියාත්මක වූ ජනමාධ්‍ය වෙතින් පැහැර හැරුණු ප්‍රධාන අංගයක් වූයේ ද එයමය.

කෙසේ වුව ද, **2004 දෙසැම්බර් 26 ද ශ්‍රී ලංකාව උඩුයටිකුරු කළ සුනාමි ඛේදවාචකයත් සමඟින් ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය එක් අරමුණක් ඔස්සේ ක්ෂණිකව ක්‍රියා කරනු ලැබුණි.** මෙම ඛේදවාචකයත් සමඟින් රටට විශාල ආධාර ප්‍රමාණයක් ගලා එමින් පවතී. රට යළි ගොඩ නැංවීමේ දී අන් කවරදාටත් වඩා සුවිශාල කාර්යභාරයක්, වගකීමක් ජනමාධ්‍ය වෙත පැවරී තිබේ. ඒ විවේචනාත්මකව මෙන්ම මධ්‍යස්ථව රට ගොඩ නැංවීමේ කාර්යභාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමයි. ජනතාව වල්මත් නොකර නිවැරදි තොරතුරු ජනතාවට දැන්වීමයි. රටට ගලා එන ආධාර මුදල් නිසි අන්දමින් යෙදවේ ද යන්න පිළිබඳව විමසිලිමත් සිටීමයි. මේ සම්බන්ධයෙන් පුළුල් මහජන මතයක් ගොඩ නැඟීමයි. රට ගොඩ නැඟීම සම්බන්ධව ඒ ඒ අංශවල බුද්ධිමතුන්ගේ, විශේෂඥයන්ගේ මෙන්ම අදාළ පාර්ශවයන්ගේ මතයන්ට අවස්ථාව සලසාදීම තුළ පුළුල් කතිකාවක් ඇති කිරීමයි. දේශපාලන අධිකාරිය විසින් ජනමාධ්‍ය වෙතින් ඉස්මතු කෙරෙන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමත්, කිසියම් වැඩ පිළිවෙලක් සැකසීමේ දී ඒවා සැලකිල්ලට ගැනීමත් සංවර්ධන සිහිනය සැබෑ කර ගැනීමේ දී අත්‍යාවශ්‍ය වේ.

මේ නිසා ඉලක්කගත නිවැරදි සංවර්ධනයක් ළඟාකර ගැනීම සඳහා ජනමාධ්‍ය, දේශපාලන අධිකාරිය මෙන්ම සිවිල් සමාජයට ද විශාල වගකීමක් පැවරෙන අතර පුද්ගලික සහ පටු අභිමතාර්ථ සාධනය සඳහා එම වගකීම් පැහැර හැරීම තුළින් සංවර්ධනය යනු කිසිදා සැබෑ කරගත නොහැකි සිහිනයක් බවට පත්වනු නියැතය.

## හේනේ පැල් මම තනියම

අඳුර
පිස එන මද නල
ගත වැදෙයි............
නිදි වරණ දැස
අඳුර විනිවිද - නුඹේ රුව
දකින්නට වෙර දරයි.....................
කොදෙව්වේ ඈත
කොහේදෝ නොදන්නා ඉසව්වක
කුංච නාදයක හඩ
සිහින සිතුවම් මකාලයි................
අනාගත කැදැල්ලට
අස්වැන්න ගෙන එන්න
මගෙ හේන රැක ගන්න
වෙලාවයි......... මේ.........
දිහ්.............දෙරිය........දිහ්
දිහ්.......... දෙරිය.......... දිහ්
අම්මපල්ල
අලි රංචුවක්ම ඇවිත්නේ................

***සී.යූ. සේනානායක***